# 'ථේරවාදය', එහි ප්‍රභවය හා විකාශය පිළිබඳ විමසුමක්

රළුවේ පද්මසිරි හිමි

## ප්‍රවේශය

'ථේරවාදය' නම් සුවිශේෂී ගුරු කුලය කෙසේ විකාශය වී ද යන්න මෙහි දී විමසනු ලැබේ. 'ථේරවාද' යන වචනය කුමන අර්ථයකින් භාවිත වේද යන්න පළමුව නිර්වචනය කළ යුතුව ඇත. මුල් බුදුසමය තුළ එක් සුවිශේෂී අර්ථයකින් යෙදුණු වචනයක් වූ 'ථේරවාද' යන්න බෞද්ධ ශාසනයේ සුවිශේෂී සම්ප්‍රදායයක් දක්වා විකාශය වූයේ කෙසේ ද? එය එසේ වූයේ කුමන කරුණු මුල් කරගෙන ද යන්න නිරාකරණය කර ගැනීම මෙහි දී වැදගත්ය. මෙම සම්ප්‍රදාය තුළ දී බුද්ධ භාෂිත දහමෙහි යම් සංවර්ධනයන් සිදු වූණි ද? එසේ සිදු වූයේ නම් ඒ කුමන අභියෝග සමග ක්‍රියා කිරීමේ දී ද? යන්න විමසිය යුතු වෙයි. ඒ සියල්ල ම අරමුණු සාධනය කිරීමේ දී පැහැදිලිව ම නිරාකරණය කර ගත යුත්තක් නම් දෙවන ධර්ම සංගීතිය පිළිබඳ කතිකාවයි. නිකාය භේදය සිදු වීම සහ මෙම සංගීතිය අතර ආවශ්‍යක සම්බන්ධතාවක් ප්‍රකට වන බව පැහැදිලි හෙයින් ද්විතිය සංගීතියේ පසුබිමෙහි සිට උක්ත කැටලුව විමසීම යහපති.

මෙම සංගායනාවට සම්බන්ධ මූලාශ්‍රය අනුව නිකාය භේදයාමී ප්‍රධාන සම්ප්‍රදාය දෙකක් ඔස්සේ දෙයාකාරව වැඩුණු බව සැලකිය හැකිය. එම කරුණු පිළිවෙළින් විශ්ලේෂණය කිරීමට පෙර පදනමක් ලෙස මෙම කරුණු කිහිපය සටහන් කිරීම වැදගත් වනු ඇත. යම් යම් වෙනස්කම් සහිතව නමුත් බොහොමයක් මූලාශ්‍රය සාක්ෂි තියනුයේ මෙම සංගීතිය බුද්ධ පරිනිර්වාණයෙන් පසුව එළඹි සියවස තුළ දී සිදුවූවක් වන බවයි. ද්විතිය සංගීතියේ ප්‍රධාන හේතු දෙකක් ප්‍රකට වෙයි.